ශීර්ෂය 285- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 285 - කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 19 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලූම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

  මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) වාණිජ අත්තිකාරම් ගිණුම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අයකර තිබූ රු. 961,980 ක ණයගැති ශේෂ 14 ක් අයවිය යුතු ශේෂ ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.	2025 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කරන බව	ණය අය කිරීම් නිවැරදි ගිණුම්වල සටහන් කර නිවැරදි ණයගැති වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය
(ii)	මහනුවර කෘෂිකර්ම නියෝජ්‍ය අධ්‍යක්ෂක කාර්යාලයෙන් ලැබිය යුතු රු.175,000 ක ණයගැති ශේෂය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.	අතපසු වීමකින් සටහන් කිරීමට නොහැකි වූ අතර, 2025 වර්ෂයේ ගිණුම සැකසීමේ දී නිවැරදි කරන බව	නිවැරදිව ණයගැති වටිනාකම් ගිණුම් ගත කළ යුතුය.
(iii)	බීජ නිෂ්පාදන ගොවිපල් 05 කට අයත් ස්ථාවර වත්කම් අයිතම 540 ක වටිනාකම හඳුනාගෙන ඊට අදාළ වත්කම් වටිනාකම හා ක්ෂයවීම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කර නොතිබුණි.	වටිනාකම හඳුනා නොගත් මෙම ස්ථාවර වත්කම්වල වටිනාකම නිවැරදිව හඳුනාගෙන 2025 වර්ෂයෙහි ක්ෂය ගැළපීමට කටයුතු කරන ලෙස නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇති බව	වත්කම් වටිනාකම් නිවැරදිව හඳුනා ගැනීමට හා ක්ෂය වටිනාකම නිවැරදිව ගණනය කර ගිණුම්ගත කිරීම කළ යුතුය.

(iv)	සීතාඑළිය බීජ නිෂ්පාදන ගොවිපලෙහි සමාලෝචිත වර්ෂයට අදාළ වැඩෙන වගාවේ පිරිවැය ගණනය කිරීමේදී රු.3,192,170 ක වියදම ඇතුලත් නොවීම හේතුවෙන් වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් වැඩි වී තිබුණි.	මෙහි ප්‍රසම්පාදන කටයුතු 2024 වර්ෂයේ සිදු වුවද එම වටිනාකමට අදාළ කිසිදු වවුචර්පතක් 2024.12.31 දිනට ඉදිරිපත් වී නොමැති හෙයින් එම වටිනාකම් 2024.12.31 දිනට වැඩෙන වගාවේ පිරිවැයට ඇතුළත් නොකළ බව	වැඩෙන වගාවේ පිරිවැය නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුය.
(v)	කෘෂිකාර්මික ගොවිපල නඩත්තු හා බීජ අලෙවි අත්තිකාරම් ගිණුමට අයත් නොවන රු.23,502,852 ක ආදායම් සමාලෝචිත වර්ෂයේ වෙනත් ආදායම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.	වෙන්දේසි ආදායම සහ නිවාස කුලී ආදායම මෙන්ම සඳතැන්න පාරිසරික කලාපය පවත්වාගෙන යාම දෙපාර්තමේන්තුවේ විෂය පථයට පරිබාහිර ක්‍රියාකාරකම් වන බැවින්, පවත්නා ක්‍රමවේදය නිවැරදි කිරීමට කටයුතු කරන බව	වාණිජ අත්තිකාරම් ගිණුමට අයත් ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුය.

(ආ) දේපල පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	වත්කම් කාණ්ඩ 05 කට අදාළව දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන තිබූ වත්කම් වටිනාකම රු.25,148,475,775 ක් වුවද, මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය (ඒසීඒ 06) තුල එය රු.30,653,168,552 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව මූල්‍ය නොවන වත්කම්වල රු.5,504,692,777 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.	2024 වර්ෂයේ දී පෙර පැවති වෙනස අවම කර ගැනීම සඳහා ප්‍රමුඛත්වය ලබා දෙන ලද බව හා තවදුරටත් පවතින වෙනස අවම කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව	දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් අතර පවතින නොසැසඳීම් සසඳා නිවැරදි ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය.
(ii)	ගොඩනැගිලි සහ ඉදිකිරීම් අයිතම 1125 ක්, ප්‍රවාහන උපකරණ 24 ක් සහ ඉඩම් 341ක් වශයෙන් වූ මූල්‍ය නොවන වත්කම් අයිතම 1490 ක් සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විට තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.	තක්සේරු වටිනාකම් ලද වහාම එම වටිනාකම් ඉදිරියේදී ගිණුම්ගත කරන බව	කඩිනම් වැඩපිළිවෙලක් සකසා වත්කම් නිවැරදිව තක්සේරු කර කඩිනමින් ගිණුම්ගත කිරීම සඳහා පියවර ගත යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ආදායම් ඇස්තමේන්තු නිවැරදිව හා තාර්කිකව පිළියෙළ නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ රු.800,000,000 කට පිළියෙල කළ ආදායම් ඇස්තමේන්තුව වර්ෂය තුල රු.750,000,000 ක් ලෙස සංශෝධනය කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ රු.926,148,764 ක ආදායම් රැස් කර තිබුණි. මූලික ඇස්තමේන්තු ආදායමට වඩා සියයට 116 ක් හා සංශෝධිත ආදායමට වඩා සියයට 124 ක් ඉපැයීම් කර තිබුණු හෙයින් ආදායම නිවැරදිව ඇස්තමේන්තු කර නොතිබුණි.	අවසන් මාස කිහිපයේ බලාපොරොත්තු නොවූ පරිදි ආදායම ඉහළ යාම හා දෙවන වර ආදායම සංශෝධනයට අවස්ථාවක් හිමි නොවීම නිසා වැඩි වූ ආදායමට සරිලන පරිදි ආදායම් ඇස්තමේන්තුව සංශෝධනය කිරීමට නොහැකි වූ බව	එළඹෙන වර්ෂවලට අදාල ආදායම කාර්යක්ෂම හා නිවැරදිව පුරෝකථනය කළ යුතුය.

3.2 වියදම් කළමනාකරණය

(අ) ප්‍රතිපාදන උපයෝජනය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	වියදම් ඇස්තමේන්තු සැකසීමේදී ඇතැම් වැය විෂයයන් සඳහා අධි ප්‍රතිපාදන සලසා ගැනීම හේතුවෙන් පුනරාවර්තන වැය විෂයයන් 03 ක හා මූලධන වැය විෂයයන් 02 ක එකතුව රු.88,700,000 ක් වූ ප්‍රතිපාදන මු.රෙ. 66	රාජ්‍ය වියදම් පාලනය සම්බන්ධයෙන් නිකුත් කරන ලද චක්‍රලේඛ අනුව කටයුතු කිරීමෙන් හා අයවැය දෙපාර්තමේන්තුව මඟින් ප්‍රතිපාදන වෙන් කිරීම් සම්බන්ධව ලබා දුන් උපදෙස් මත	හැකිතාක් නිවැරදිව වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය.

	මගින් වෙනත් වැය විෂයයන් සඳහා මාරු කර තිබුණු අතර එය සියයට 24 සිට සියයට 97 දක්වා පරාසයක විය.	ක්‍රියා කිරීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වූ බව	
(ii)	සමාලෝචිත වර්ෂයේ වැඩ සටහන් 01 හා 02 යටතේ වෙන් කර තිබූ රු.539,160,000 ක ශුද්ධ පුනරාවර්තන ප්‍රතිපාදන අතුරින් රු.175,961,422 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 32.6 ක ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි.	භාණ්ඩාගාර ලේකම්ගේ අංක BD/CBP/01/01/01-2024 හා 2024.01.10 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024, අංක BD/CBP/01/01/05-2023 හා 2023.12.29 දිනැති 05/2023 අයවැය චක්‍රලේඛ වලට අනුව වියදම් පාලනය කිරීම මේ සඳහා හේතු වූ බව	ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කිරීමටත් වෙන් කළ ප්‍රතිපාදන උපරිම වශයෙන් උපයෝජනය කිරීමටත් කටයුතු යුතුය.
(iii)	සමාලෝචිත වර්ෂයේ වැඩ සටහන් 01 හා 02 යටතේ වෙන් කර තිබූ රු.630,830,000 ක ශුද්ධ ප්‍රාග්ධන ප්‍රතිපාදන අතුරින් රු.196,679,333 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 31 ක ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි.	අයවැය චක්‍රලේඛ 01/2023 හි උපදෙස් ප්‍රකාරව අරපිරිමැසුම්දායි ලෙස දැඩි පාලනයට යටත්ව වියදම් කිරීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වූ බව	ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කිරීමටත් වෙන් කළ ප්‍රතිපාදන උපරිම වශයෙන් උපයෝජනය කර ගැනීමටත් කටයුතු කළ යුතුය.

3.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

	විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ බැඳීම් හා බැරකම් පිළිබඳ සටහන (iv) අනුව 2024 දෙසැම්බර් 31 දිනට බැඳීම් හා බැරකම් ශේෂය රු.11,808,310 ක් වුවද භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත SA 92 අනුව එම ශේෂය රු.97,546,807 ක් විය. තවද භාණ්ඩාගාරය වෙත වාර්තා නොකළ අවස්ථා 61 කට අදාළ රු.614,462 ක බැරකම්, මූල්‍ය ප්‍රකාශන තුල ඇතුළත් කර තිබුණි.	දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයට බැහැර වෙනත් කාර්යාල වලින් ලැබෙන බිල්පත් ප්‍රමාද වී ලැබීම හේතුවෙන් මු.රෙ.115 ප්‍රකාරව අනුමැතිය ලබා ගෙන ගෙවීම් කටයුතු සිදු කළ බව	බැඳීම් හා බැරකම් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් වන බව තහවුරු වන පරිදි වූ අභ්‍යන්තර වැඩපිළිවෙලක් සකසා ක්‍රියාත්මක කළ යුතුය.
(ආ)	භාණ්ඩාගාරය වෙත වාර්තා නොකළ කිසිදු බැඳීමක් හෝ බැරකමක්, පෙර වර්ෂයේ වියදමක් ලෙස 2025 වර්ෂයේ නිරවුල් නොකළ යුතු වුවත්, භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත (SA 92) බැඳීම් හා බැරකම් ප්‍රකාශයේ ඇතුළත්	ප්‍රධාන කාර්යාලයට බැහැර වෙනත් කාර්යාල වලින් ලැබෙන බිල්පත් ප්‍රමාද වී ලැබීම හේතුවෙන් මු.රෙ.115 ප්‍රකාරව අනුමැතිය ලබා ගෙන ගෙවීම් කටයුතු සිදු කළ බව	බැරකම් නිසි පරිදි වාර්තා නොකිරීම සම්බන්ධයෙන් අදාල නිලධාරීන් සම්බන්ධව විධිමත් පරිදි ක්‍රියා කිරීමටත්, ඉදිරියේදී බැඳීම් හා බැරකම්

	නොවූ සමාලෝචිත වර්ෂයට අදාල එකතුව රු.4,629,683 ක බැරකම් 2025 වර්ෂයේදී ගෙවීමට කටයුතු කර තිබුණි.		නිවැරදිව භාණ්ඩාගාරය වෙත වාර්තා කළ පසු ගෙවීම් කටයුතු කළ යුතුය.
(ඇ)	මු.රෙ. 94(1) අනුකූල නොවන පරිදි, වැය විෂයයන් දෙකක ප්‍රතිපාදන සීමාව ඉක්මවා රු.2,421,050 ක බැදීම්වලට එළඹ තිබුණි.	ජල, විදුලි සහ දුරකථන බිල්පත් දෛනික කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාම අත්‍යාවශ්‍ය වන බැවින්, මෙම ගෙවීම් කටයුතු සිදු කළ බව හා මු.රෙ.94(1) ප්‍රකාරව ඉදිරියේදී කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇති බව	ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් වළක්වා ගැනීමට වැඩපිළිවෙලක් යොදා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.

3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	විගණන නිරීක්ෂණය			ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
	නීති,රීති හා රෙගුලාසිවලට යොමුව	වටිනාකම රු.	අනුකූල නොවීම		
(අ)	1980 අංක 37 දරන පළිබෝධනාශක පාලනය කිරීමේ පනතේ 26 වන වගන්තිය යටතේ නිකුත් කළ අංක 1655/7 දරන 2010 මැයි 25 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය	-	නියැදි පරීක්ෂාවේදී අනාවරණය වූ පරිදි විගණිත දිනය වූ 2025 පෙබරවාරි 27 දින වන විට වෙළෙඳසැල් 05 ක් 2024 වර්ෂය සඳහා ලබා ගත යුතු වාර්ෂික බලපත්‍රය ලබා නොගෙන පළිබෝධනාශක වෙළඳාම් කටයුතු සිදු කරමින් පැවතුණි.	අදහස් දක්වා නොමැත.	අදාළ වෙළඳසැල්වලට එරෙහිව කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධව විධිමත් පරිදි කටයුතු කිරීමටත්, අදාල පනත හා ගැසට් පත්‍රය ප්‍රකාරව වෙළඳසැල් සම්බන්ධව නීතිමය කටයුතු සිදු කිරීමත් කළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 22 වගන්තිය	2,583,180	කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් අනුරාධපුර ගොවිපල් යාන්ත්‍රික පර්යේෂණ මධ්‍යස්ථානයේ යාන්ත්‍රික ඉංජිනේරුවරයා අනුමත කරගෙන නොතිබූ නිවාඩු දින 85 ½ ක් ඇතුළත්ව	2023 වර්ෂය තුළ ලබාගෙන ඇති වැටුප් රහිත නිවාඩු අනුමත කර ගැනීම සඳහා කටයුතු කරමින් පවතින බව	ආයතන සංග්‍රහය අනුව විනයානුකූල කටයුතු කළ යුතුය.

2023 ජනවාරි සිට 2024 ජූලි 31 දක්වා කාලය තුළ දින 175 ක් නිවාඩු ලබාගෙන තිබුණද, ඒ පිළිබඳ අවධානය යොමු කිරීමෙන් තොරව අඛණ්ඩව වැටුප් ගෙවීම් කර තිබුණි.

3.5 වංචනික ස්වරූපයේ ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අනුරාධපුර ශ්‍රී මහා බෝධියේ උඩමළුව පරිශ්‍රයේ අදියර 03 ක් යටතේ රු.45,202,964 ක වියදමින් ඉදිකර තිබූ හෙළ බොජුන්හලේ එක් අදියරකදී ගෙවා තිබූ වැඩ කොටස් ව්‍යාජ ලෙස නැවත ඇස්තමේන්තු කර ගෙවීම් කිරීම, භෞතිකව පවතින ප්‍රමාණයකට වඩා වැඩි ප්‍රමාණයක් මිණුම් කර ගෙවීම් කිරීම හා සාවද්‍ය ලෙස ඉටු නොකළ කාර්යයන් සඳහා ගෙවීම කිරීම හේතුවෙන් මෙම ඉදිකිරීම තුල රු.1,824,826 ක අධි ගෙවීමක් පැවතුණි.	අනාවරණය වී ඇති අධි ගෙවීම් කොන්ත්‍රාත්කරු වෙත ගෙවීමට ඇති රඳවුම් මුදලින් අය කර ගැනීමට කටයුතු කරන බව	අධි ගෙවීම සිදු කළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගැනීමටත්, නිවැරදි ඇස්තමේන්තු මත පදනම්ව ඉටු කළ කාර්යයන් සඳහා පමණක් ගෙවීම් කර අධි ගෙවීම් අදාළ පාර්ශ්ව වෙතින් අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ආ)	මු.රෙ. 767 (1) ට අනුකූල නොවන පරිදි නිල්ලඹ සමෘද්ධි මධ්‍යස්ථානය විසින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත පවරන ලද ශීතාගාර 02 ට අයත් උපාංගවලට අදාල නිකුත් නියෝග 04 ක් වෙනුවෙන් පොදු 219 යටතේ ලැබීම් නියෝග නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණ එම අයිතම රු.285,000 ක මුදලකට ඇස්තමේන්තු කර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මුදල් අංශයේ අංක 05/2014 සහ 06/2014 චක්‍රලේඛවලට අනුකූල නොවන පරිදි බාහිර පාර්ශවයන්ට ලබා දීමට කටයුතු කර තිබුණි.	මෙම උපාංග වසර 30 ක් පමණ පැරණි වූ අතර භාවිතයට ගැනීමට නොහැකි බැවින් එම අයිතමයන් ප්‍රසම්පාදන ක්‍රියාවලියේ පියවරක් ඔස්සේ ලංසුකරු වෙත ලබා දුන් බව	මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධව විධිමත් පරිදි කටයුතු කළ යුතුය .

(ඇ)	2022 මැයි සිට 2023 දෙසැම්බර් දක්වා කාලය තුල උඩරදැල්ල බීජ අර්තාපල් නිෂ්පාදන ගොවිපලේ සේවය කරන කොන්ත්‍රාත් කම්කරු සේවයේ අයෙකු විසින් ඩීසල්, පෙට්‍රල්, ඔයිල් හා ග්‍රීස් මිලදී ගැනීම වෙනුවෙන් පිළියෙළ කරන ලද ව්‍යාජ බිල් පත්‍ර භාවිතා කර රු. 3,127,490 ක් පෞද්ගලික ඉන්ධන පිරවුම්හලක් වෙත ගෙවීමට කටයුතු කර තිබුණි.	ව්‍යාජ බිල්පත් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදු කර වාර්තාවක් ලබා දෙන ලෙස උපදෙස් ලබා දී ඇති බව	අදාල පරීක්ෂණ කටයුතු කඩිනම් කර රජයට සිදුවූ අලාභය පියවා ගැනීමටත්, වගකිවයුතු පාර්ශ්ව සම්බන්ධයෙන් විධිමත් පරිදි කටයුතු කිරීමත් කළ යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1. සැලැසුම් කිරිම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදයට අනුකූල නොවන පරිදි කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමාලෝචිත වර්ෂයට අදාල සාමාන්‍ය ප්‍රාග්ධන හා විශේෂ ව්‍යාපෘති සඳහා වූ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම සහ සංශෝධිත තාක්ෂණික ක්‍රියාකාරී සැලැස්ම කාලීනව සකසා නොතිබුණ අතර, ඒවා පිළිවෙලින් 2025 මාර්තු 11 දින සහ 2025 අප්‍රේල් 09 දින විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි.	ඉදිරියට මේ පිළිබඳ ප්‍රමුඛ අවධානය යොමු කරමින් ප්‍රමාදයකින් තොරව නියමිත කාල රාමුව තුළ සැලසුම් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බව	නියමිත කාලසීමාව තුළ සැලසුම් සකසා ඉදිරිපත් නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පරිදි කටයුතු කිරීමටත්, ඉදිරියේදී නියමිත කාල සීමාව තුළ සැලසුම් සැකසීම තහවුරු වන බවට වැඩපිළිවෙලක් සැකසීමටත් පියවර ගත යුතුය.

4.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2023 වර්ෂයේ සිට බඩඉරිඟු වගාව ප්‍රවර්ධනය වෙනුවෙන් ව්‍යාපෘති 03 ක් යටතේ අනුරාධපුර අන්තර් පළාත් කලාප සඳහා රු.9,462,220 ක් වැය කර තිබුණද, 2024 යල කන්නය මඟින් අපේක්ෂා කළ ඉලක්කයෙන් සියයට 50 ක ප්‍රමාණයක් අත්පත් කර ගැනීමට අපොහොසත් වී තිබුණි.	බඩඉරිඟු වගාවට අදාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක වුවත්, බඩඉරිඟු බීජ ආනයනය කිරීම , බඩඉරිඟු සඳහා පොහොර සහනාධාර නොලැබීම පොහොර, යන්ත්‍ර සූත්‍ර හා ශ්‍රම පිරිවැය අධික වීම යන හේතු මත ගොවීන් වගාවලින් ඉවත් වීමෙන් අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට අපහසු වූ බව.	ව්‍යාපෘති අධීක්ෂණය කළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගැනීමටත්, අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට වැඩපිළිවෙලක් සැකසීමටත් පියවර ගත යුතුය.

(ආ)	අතිරේක ආහාර බෝග නිෂ්පාදන ඵලදායීතාව ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය යටතේ 2023 වර්ෂයේ ලොකු ළූණු ගොවීන් වෙත දිරිදීමනා වශයෙන් අනුරාධපුර අන්තර් පළාත් කලාපය තුල රු. 2,661,825 ක් ගෙවා ඇතත් 2023 යල කන්නයේ හෙක්ටයාර් 700 ක අපේක්ෂිත ඉලක්කයෙන් ළඟා කරගත් ප්‍රගතිය හෙක්ටයාර් 13.2 ක් පමණක් විය. එය අපේක්ෂිත ඉලක්කයන් සියයට 1.8 ක් වැනි අවම අගයක් විය.	අතිරේක ආහාර බෝග සඳහා සහනාධාර නොලැබීම, අස්වැන්නට නිසි මිලක් නොලැබීම, අනපේක්ෂිත වියළි කාලගුණික තත්තවය හා රජය ලොකු ළූණු ආනයනය කිරීම මත ගොවීන් ලොකු ළූණු වගාවෙන් ඉවත් වීම යන කරුණු හේතුවෙන් අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වූ බව.	- එම -
(ඇ)	කුණ්ඩසාලේ රජයේ බීජ නිෂ්පාදන ගොවිපලේ පසුගිය කන්න 04 ක අපේක්ෂිත මුළු බීජ නිෂ්පාදනය කි.ග්‍රෑ. 10,530 ක් වුවද, රු. 20,706,591 ක පිරිවැයක් දරා බීජ කි.ග්‍රෑ. 2,717 ක් පමණක් නිෂ්පාදනය කර තිබුණි. එය අපේක්ෂිත ඉලක්කයෙන් සියයට 25 ක් වැනි ඉතා අඩු මට්ටමක් විය.	අහිතකර කාලගුණික තත්ත්වය හා ප්‍රමාණවත් මානව සම්පතක් නොමැති වීම හේතුවෙන් නිෂ්පාදන ඉලක්ක ළගා කර ගැනීමට නොහැකි වූ බව	- එම -
(ඈ)	කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සීතාඑළිය බීජ අර්තාපල් ගොවිපල, 2022 හා 2024 යල කන්නවලදී අපේක්ෂිත බීජ අස්වැන්න පිළිවෙලින් සියයට 63 කින් හා සියයට 59 කින් ළඟා කර ගැනීමට අපොහොසත් වී තිබුණි.	රට තුළ ඇති වූ ඉන්ධන හිඟය, වියළි කාලගුණය හා සුළිං කුණාටු තත්ත්වය හේතුවෙන් අපේක්ෂිත ඉලක්ක සපුරා ගත නොහැකි වූ බව	- එම -
(ඉ)	පැල්වෙහෙර නියෝජ්‍ය අධ්‍යක්ෂ (බීජ) කාර්යාලය සඳහා 2024 යල කන්නයට අදාළව කොන්ත්‍රාත් බීජ වැඩ සටහන යටතේ බෝග වර්ග 03 ක් සඳහා ලබා දී තිබූ කි.ග්‍රෑ. 33620 ක ඉලක්කයෙන් කි.ග්‍රෑ. 21320 ක ප්‍රමාණයක් හෙවත් සියයට 63 ක් අත්පත් කර ගැනීමට අපොහොසත් වී තිබුණි.	වෙළඳපල පවතින තත්ත්වයන් හා පාරිසරික තත්ත්වයන් මත ප්‍රගතිය අඩුවී ඇති බව	- එම -
(ඊ)	මීපිළිමාන රජයේ බීජ අර්තාපල් නිෂ්පාදන ගොවිපලේ 2021 යල කන්නයට සාපේක්ෂව 2023 යල කන්නයේ බීජ අර්තාපල් නිෂ්පාදනය සියයට 50 කින් පහල ගොස් තිබූ අතර 2021/ 2022 මහ කන්නයට සාපේක්ෂව 2023/2024 මහ කන්නයේ බීජ අර්තාපල් නිෂ්පාදනය සියයට 43 කින් පහල ගොස් තිබුණි.	වගා වපසරිය අඩු වීම,අයහපත් කාලගුණික තත්ත්ව හා කෘමි සත්ත්ව උවදුරු යන හේතූන් මත බීජ නිෂ්පාදනය පහල මට්ටමක පැවතුණු බව	- එම -

4.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම	නිර්දේශය
(අ)	අනුරාධපුර ගොවිපල් යාන්ත්‍රික පුහුණු මධ්‍යස්ථාන පරිශ්‍රයේ විධිමත් ඉංජිනේරු සැලැස්මක් හා ශක්‍යතා අධ්‍යයනයකින් තොරව රු.13,315,979 ක පිරිවැයකට Ones stop අලෙවිසැලක් හා කෘෂි උපකරණ කුලියට ලබා දීමේ මධ්‍යස්ථානයක් ඉදිකර ඒ සඳහා රු.11,732,900 ක් වැය කර කෘෂි උපකරණ මිලදී ගෙන තිබුණද, ඒවා භාවිතයට නොගෙන වසර 05 කට අධික කාලයක් නිෂ්කාර්යයව පැවතුණි. තවද, රු.7,133,153 ක වියදම් දරා බටඅත කෘෂි තාක්ෂණික උද්‍යානය තුල ඉදිකර තිබූ Ones stop අලෙවිසැලද ඌන උපයෝජිතව පැවතුණි.	කෘෂි උපකරණ කුලී පදනම මත ලබා දීම සඳහා නිසි ක්‍රමවේදයක් නොතිබුණු අතර කෘෂි උපකරණ ව්‍යාප්ති පුහුණු වැඩ සටහන් හා ආදර්ශන කටයුතු සඳහා භාවිතා කළද කොරෝනා ව්‍යාප්තිය හා ඉන්ධන ගැටළු මත පුහුණු පාඨමාලා සම්පූර්ණයෙන් නවතා දමන ලද බව, හා බටඅත කෘෂි තාක්ෂණික උද්‍යානය තුල ඉදිකර තිබෙන one stop අලෙවි සැල තුල අලෙවි අවස්ථා වැඩි කර ගැනීම සඳහා GAP සහතිකකරණය යටතේ වගා කරනු ලබන ගොවීන්ගේ නිෂ්පාදන අලෙවියට අවශ්‍ය ක්‍රමවේද සකස් කරමින් පවතින බව.	වත්කම් පූර්ණ උපයෝජනය කිරීමට කටයුතු නොකළ වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගැනීමටත්, ඌන උපයෝජිත වත්කම්වලින් ප්‍රතිලාභ ලබා ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමටත් පියවර ගත යුතුය.
(ආ)	කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ හා රෝපණ ද්‍රව්‍ය මධ්‍යස්ථානය විසින් එකක් රු.2,407,410 කට ගොවිපල් 04 ක් සඳහා රු.9,629,640 ක් වටිනා ඉන්ධන ගබඩා කිරීමේ ටැංකි 04 ක් මිලදී ගෙන 2025 පෙබරවාරි වන විට වසර 02 කට අධික කාලයක් නිෂ්කාර්යයව පැවතුණි.	අදහස් දක්වා නොමැත	- එම -
(ඇ)	මීපිළිමාන රජයේ බීජ අර්තාපල් නිෂ්පාදන ගොවිපලේ 2021 යල කන්නයේ සිට 2024 යල කන්නය දක්වා වූ කන්න 07 කින් කන්න 03 ක් තුල වියදමට සාපේක්ෂව ආදායම සියයට 67 සිට සියයට 53 දක්වා පරාසයක් තුල අඩු වී තිබුණි.	ගොවිපලේ මෙම තත්ත්වය කළමනාකරණය කර ගැනීමේදී රෝග පළිබෝධ හානි, අයහපත් කාලගුණික තත්ත්ව හා අධික මානව සම්පත් හිඟය යන කරුණු බාධාවක් වී ඇති බව.	අපේක්ෂිත ප්‍රතිලාභ ලබා කර ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් සකස් කළ යුතුය.

4.4 ප්‍රසම්පාදනයන්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ හා රෝපණ ද්‍රව්‍ය මධ්‍යස්ථානය විසින් කුණ්ඩසාලේ හා පැල් වෙහෙර නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාල තුල ස්ථාපිත තාප පරිවාරක කාමර සඳහා ශීතාගාර උපාංග සවි කිරීමේ කොන්ත්‍රාත්තුව පිරිනැමීමේදී වසර 05 ක පළපුරුද්ද සලකා බලන බවට ප්‍රසම්පාදන ලේඛනවල දක්වා ඇතත්, ඒ පිළිබඳ අවධානය යොමු නොකර සේවා පළපුරුද්ද වෙනුවෙන් සාවද්‍ය ලේඛන ඉදිරිපත් කළ හා CIDA වර්ග කිරීම අනුව C (Construction) යටතේ ලියාපදිංචි කොන්ත්‍රාත් ආයතනයක් වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට කටයුතු කර තිබුණි.	ගොඩනැගිලි සේවා ඉංජිනේරු කාර්යයන් මෙම ව්‍යාපෘතියට අදාල ඉංජිනේරු ක්ෂේත්‍රය වන C කාණ්ඩය හෝ EM කාණ්ඩය යටතේ කොන්ත්‍රාත්කරුවන් විසින් සිදු කරන අතර, කොන්ත්‍රාත්කරුගේ උපදේශන ඉංජිනේරුවරයාගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් මෙම ව්‍යාපෘතියට ගැලපෙන බව.	අවිධිමත් ප්‍රසම්පාදන කටයුතුවලට වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගැනීමටත්, ඉදිරියේදී ප්‍රසම්පාදන කටයුතු විනිවිදභාවයකින් යුතුව සිදු කිරීමටත් පියවර ගත යුතුය.
(ආ)	බීජ නිෂ්පාදන ගොවිපලවල් සඳහා එකක් රු. 2,407,410 ක් බැගින් රු.9,629,640 ක් වටිනා ඩීසල් ගබඩා කිරීමේ ටැංකි 04 ක් 2022 වර්ෂයේදී මිලදී ගැනීම වෙනුවෙන් ටැංකියක් රු.2,499,750 කට ඇස්තමේන්තු කර තිබූ නමුත් වර්තමානයේ මෙම ඩීසල් ගබඩා කිරීමේ ටැංකියක වෙළඳපල මිල රු.1,450,000 ක් වන බව විගණන පරීක්ෂාවේදී අනාවරණය විය.	අදහස් දක්වා නොමැත	රජයට උපරිම වාසි වන පරිදි ප්‍රසම්පාදන කටයුතු සිදු කළ යුතු අතර, විධිමත් පරීක්ෂාවක් සිදු කර අක්‍රමිකතාවයක් පවතී නම් ඊට වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීම කළ යුතුය.
(ඇ)	කුණ්ඩසාලේ හා පැල්වෙහෙර නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාල 02 තුල ඉදිකර තිබූ තාප පරිවාරක කාමර 02 සඳහා අවශ්‍ය ශීතාගාර උපාංග මිලදී ගැනීම සඳහා එකක් රු.15,073,620 ක පිරිවැයකට පිළියෙල කර තිබූ ඇස්තමේන්තු 02 ක් වෙනුවෙන් පදනම් කරගත් මිල විශ්ලේෂණයන් හා අනෙකුත් ලේඛන විගණනයට ඉදිරිපත් නොකරන ලදී.	යාන්ත්‍රික ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා රජයේ අනුමත BSR මිල ගණන් සකස් කර නොමැති බැවින් මෙම ක්ෂේත්‍රය සඳහා විශේෂ මිල ගණන් සකස් කළ යුතු අතර HVAC ක්ෂේත්‍රයේ ඇස්තමේන්තු සකස් කිරීමේ දී සලකා බලනු ලබන සියළු නිර්ණායක තාර්කික පදනමින් සලකා බලා ඇස්තමේන්තු සකස් කර ඇති බව.	ඇස්තමේන්තුවලට අදාල මිල විශ්ලේෂණයන් හා අනෙකුත් ලේඛන විගණනයට ඉදිරිපත් කිරීමටත්, ඒවා ඉදිරිපත් නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පරිදි කටයුතු කිරීමත් කළ යුතුය.

(ඈ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 අනුව ජාතික තරඟකාරී ලංසු කැඳවීමක් කළ යුතු ප්‍රසම්පාදන කටයුත්තක් සඳහා වෙළඳපොල මිල සැසඳුම් ක්‍රමය භාවිතා කර බීජ හා රෝපණ ද්‍රව්‍ය මධ්‍යස්ථානය හා නියෝජ්‍ය අධ්‍යක්ෂ (බීජ) කාර්යාල විසින් 2023 හා 2024 වර්ෂයන්වල රු.35,432,358 ක් වටිනා සූර්යබල වීථි ලාම්පු 474 ක් මිලදී ගෙන ස්ථාපිත කර තිබුණි.	ප්‍රමාණවත් කාල සීමාවක් නොමැති වූ බැවින්, මිල සැසඳුම් ක්‍රමය භාවිතා කළ බව හා ඉදිරියට නිවැරදි ප්‍රසම්පාදන ක්‍රමය භාවිතා කරන බව	ප්‍රසම්පාදන කටයුතු කළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගැනීමටත් හැකිතාක් විවෘත ප්‍රසම්පාදන කැඳවීම් කර ප්‍රසම්පාදනයේ අරමුණු ඉටුවන අයුරින් කටයුතු කිරීමටත් පියවර ගත යුතුය.
(ඉ)	මුදල් රෙගුලාසි 137(2) ට අනුකූල නොවන පරිදි බීජ හා රෝපණ ද්‍රව්‍ය මධ්‍යස්ථානය හා නියෝජ්‍ය අධ්‍යක්ෂ (බීජ) කාර්යාල 08 ක් විසින් 2023 හා 2024 වර්ෂයන්වල වීථි ලාම්පු 337 ක් ස්ථාපිත කිරීමේදී පිරිවිතර පරීක්ෂා නොකර රු.25,652,827 ක් ගෙවීම් කර තිබුණි.	වීථි ලාම්පුවල නිෂ්පාදිත රට නෙදර්ලන්තය වන අතර පිරිවිතර වල සඳහන් "Panel Voltage" අගය අදාළ ඉංජිනේරුවරුන් විසින් පරීක්ෂා කර ඇති බව, වගකීම් කාලය හා සේවා කිරීම් පිළිබඳව ගෙවීම් බිල්පත් වල සඳහන් කර කොන්ත්‍රාත්කරු සමඟ එකඟතාවය ලබාගෙන ඇති බව	පිරිවිතර අනුව ලද භාණ්ඩවල තත්ත්වය පරීක්ෂා නොකර ගෙවීම් කළ නිළධාරීන් සම්බන්ධයෙන් විධිමත් පරිදි කටයුතු කළ යුතුය.

4.5 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනතේ 224 වන වගන්තිය ප්‍රකාරව ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවලට අයත් ඉඩම් මැනීම් කටයුතු සිදුකර විධිමත්ව පවරා ගැනීමට කටයුතු කළ යුතු වුවද, ඒකක 04 කට අයත් හෙක්ටයාර් 51.92039 ක ඉඩම් පවරා ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි.	ඉඩම් පවරා ගැනීමට අදාල කටයුතු සිදු කරමින් පවතින බව.	කඩිනම්ව පවරා ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	කුණ්ඩසාලේ රජයේ බීජ නිෂ්පාදන ගොවිපලෙහි D කොටසට අයත් අක්කර 1.5 ක පමණ භූමි ප්‍රමාණයක් 1993 වර්ෂයේ සිට ප්‍රදේශවාසීන් විසින් අනවසරයෙන් භුක්ති විඳිමින් පැවතුණද, එය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	අනවසරකරුවන් පදිංචි ඉඩම් කොටස් පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව.	අනවසර ඉඩම් කඩිනම්ව පවරා ගැනීමට කටයුතු කළ යුතුය

(ඇ)	පැල්වෙහෙර නියෝජ්‍ය අධ්‍යක්ෂ (බීජ) කාර්යාලය සඳහා 2012 වර්ෂයේදී රු.7,707,544 කට මිලදී ගෙන තිබූ ස්වයංක්‍රීය බීජ ඇසුරුම් යන්ත්‍රය 2017 වර්ෂය දක්වා බීජ පැකට් 4551 ක් පමණක් ඇසුරුම් කර 2017 වර්ෂයේ සිට වසර 08 ක කාලයක් භාවිතයට නොගෙන නිෂ්කාර්යයව පැවතුණි.	මෙම යන්ත්‍රය බහුලව භාවිතයට ගනු නොලබන විශේෂ යන්ත්‍රයක් වන අතර යන්ත්‍රයේ දේශිය නියෝජිත සමාගම වෙතින් ඉදිරියේ දී අලුත්වැඩියා කටයුතු සිදු කරනු ලබන බව	නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් අළුත්වැඩියා කර හෝ සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන උපයෝජනයට හෝ තවදුරටත් පවත්වා ගැනීම ඵලදායී නොවන්නේ නම් විධිමත් පරිදි කටයුතු කර අපහරණයට කටයුතු කළ යුතුය.
(ඈ)	පැල්වෙහෙර නියෝජ්‍ය අධ්‍යක්ෂ (බීජ) කාර්යාලය සඳහා රු. 500,000 ක මුදලකට 2010 වර්ෂයේ මිලදී ගෙන තිබූ බීජ වියලන යන්ත්‍රය ක්‍රියාකාරී තත්ත්වයෙන් පැවතියත් දැනට වසර 05 ක කාලයක් නිෂ්කාර්යයව පැවතුණි.	මෙම යන්ත්‍රය පිළිබඳව යාන්ත්‍රික ඉංජිනේරු නිර්දේශයක් ලබාගෙන එම නිර්දේශයන් අනුව ඉදිරි කටයුතු සිදු කරන බව	- එම -
(ඉ)	පැල්වෙහෙර නියෝජ්‍ය අධ්‍යක්ෂ (බීජ) කාර්යාලය සඳහා 2015 වර්ෂයේ මිලදී ගෙන තිබූ රු. 1,910,699 ක් වටිනා ශීත ගබඩාව ඒ සඳහා ඉදිකර තිබූ ගොඩනැගිලි සමඟ භාවිතයට නොගෙන වසරකට අධික කාලයක් නිෂ්කාර්යයව පැවතුණි.	ශිත ගබඩාවේ දෝෂ අලුත්වැඩියාව සඳහා වන යාන්ත්‍රික ඉංජිනේරු නිර්දේශයන් ලද පසු එහි අලුත්වැඩියාවන් හා සම්බන්ධ ඉදිරි කටයුතු සිදු කරන බව	- එම -
(ඊ)	මීපිළිමාන රජයේ බීජ අර්තාපල් නිෂ්පාදන ගොවිපලේ විදුලි වැට අළුත්වැඩියාව සඳහා 2016 වර්ෂයේ මිලදී ගෙන තිබූ රු.513,538 ක් වටිනා උපකරණ භාවිතයට නොගෙන වසර 08 ක කාලයක් නිෂ්කාර්යයව පැවතුණි.	සාමාන්‍ය හා ප්‍රාදේශිය වෙළඳපොලෙන් හදිසි අවස්ථාවන්වල පහසුවෙන් මිලදී ගත නොහැකි බැවින් ප්‍රසම්පාදනය කර ගබඩා කර ඇති බව	- එම -

4.6 පාඩු හා හානි

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පරීක්ෂණ කටයුතු අවසන් නොකළ 1976 වර්ෂයේ සිට පවතින ඇස්තමේන්තුගත වටිනාකම රු. 110,622,350 ක් වූ පාඩු හා හානි සිද්ධි 389 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ නමුත්, ඉදිරිපත් කළ උප ලේඛන අනුව	වත්කම් කළමනාකරණ ශාඛාව වෙත වාර්තා වී ඇති හානි හා පාඩු සිද්ධිවලට අමතරව භාණ්ඩ සමීක්ෂණ මඟින් හඳුනාගත් ගොනු පැවතීම හේතුවෙන් සිද්ධිවල පරස්පරතාවයක් ඇති බව	මුදල් රෙගුලාසි ප්‍රකාරව පාඩු හා හානි සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු කළ යුතු අතර පරීක්ෂණ වාර්තා නිම නොකළ

	2024 දෙසැම්බර් 31 දිනට හානි හා පාඩු සිද්ධි 432 ක් පැවතුණි.		නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	නියැදි පරීක්ෂාවට අනුව මු.රෙ 104 (3) පරීක්ෂණවල දීර්ඝකාලීන ප්‍රමාදය හේතුවෙන් සිද්ධි 29 කට අදාළ එකතුව රු.5,779,244 ක් වූ හානි හා පාඩු මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරවු කර නොතිබුණි.	2024.12.31 දිනට වත්කම් කළමනාකරණ අංශය වෙත වාර්තා වූ සිද්ධීන් මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් කළ බව	පරීක්ෂණ කඩිනමින් සිදු කර පාඩු හා හානි නිවැරදිව මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් කළ යුතුය.

4.7 අනාර්ථික ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය 2024 වර්ෂයේ ජල හා විදුලි ගාස්තු වෙනුවෙන් පිළිවෙලින් රු.2,308,180 ක් හා රු.4,766,862 ක් වැය කර තිබූ නමුත්, ප්‍රධාන කාර්යාල පරිශ්‍රය තුල ක්‍රියාත්මක කර තිබූ එකතුව රු.6,896,229 ක ඉදිකිරීම් කොන්ත්‍රාත් 04 ක් සඳහා කිසිදු මුදලක් අය කිරීමකින් තොරව ජලය හා විදුලිය ලබා දීමට කටයුතු කර තිබුණි.	කොන්ත්‍රාතකරු විසින් පරිභෝජනය කරන ලද ජල හා විදුලි ගාස්තු සඳහා කොන්ත්‍රාත්කරු සමඟ සාකච්ඡා කර මුදලින් හෝ බිල්පතකින් හෝ රඳවුම් මුදල් මඟින් අයකර ගැනීමට කටයුතු කරන බව	අදාල වටිනාකම් ගණනය කර වගකිවයුතු පාර්ශ්ව වෙතින් අයකරගත යුතුය.

4.8 කළමනාකරණ දුර්වලතා

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2003 අංක 22 දරන බීජ පනතේ 18 වගන්තිය ප්‍රකාරව, පනතේ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නීති රෙගුලාසි කෙටුම්පත් කර 2018 වර්ෂයේ දී නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර වසර 06 ක කාලයක් ගත වී ඇතත්, බීජ පනතේ 18.5 උප වගන්තිය ප්‍රකාරව අදාළ නියෝග ගැසට් පත්‍රයේ පළකර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු විගණිත දිනය වූ 2024 දෙසැම්බර් 23 දින දක්වා සිදුකර නොතිබුණි.	කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් බීජ පනතට අදාල කෙටුම්පත් නියෝග මේ වන විට ලැබී ඇති අතර මේ සම්බන්ධයෙන් වන රෙගුලාසි සඳහා නිරීක්ෂණ සකස් කර කඩිනමින් නීති කෙටුම්පත් සම්පාදක වෙත යැවීමට කටයුතු කරන බව	අදාළ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට කඩිනම් වැඩපිළිවෙලක් සැකසිය යුතුය.

(ආ)	1980 අංක 33 දරන පළිබෝධනාශක පාලනය කිරීමේ පනතේ 19 (1) වගන්තිය ප්‍රකාරව පලිබෝධනාශක තොග වශයෙන් ගබඩා කිරීමේ කාර්යය සඳහා වූ විශේෂ ගබඩාවක හැර වෙනත් ස්ථානයක තොග වශයෙන් ගබඩා කිරීම කිසිම තැනැත්තෙකු විසින් නොකරනු ලැබිය යුතු බව දන්වා ඇතත්, නඩු කටයුතු අවසන් වී අපහරණය කිරීමට පවතින තොග හා වැටලීම් සිදුකර නඩු කටයුතු වෙනුවෙන් ඉදිරිපත් කිරීමට ඇති තොග පලිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාල පරිශ්‍රයේ ගොඩනැගිලි කාමරවල අවිධිමත් හා අක්‍රමවත් ලෙසට ගොඩගසා තිබුණි.	පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයේ දැනට පවත්වාගෙන යනු ලබන ගබඩාව තාවකාලික පියවරක් ලෙස පමණක් පවත්වා ගෙන යාමට සිදුව ඇති බව	අදාළ පනතේ නියමයන් ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඇ)	1980 අංක 33 දරන පළිබෝධනාශක පාලනය කිරීමේ පනතේ 21(2) වගන්තියට අනුව පළිබෝධනාශකවල සාම්පල ලබා ගැනීම බලයලත් නිලධාරියෙකු විසින් ඉටුකළ යුතු කාර්යයන් යටතේ දක්වා ඇතත්, එසේ කටයුතු කිරීමෙන් තොරව සමාගම විසින් ලබා ගන්නා සාම්පල පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය වෙත විශ්ලේෂණ කටයුතු සඳහා යොමු කරන බැවින් සාම්පල් ලබාගැනීමේ ක්‍රමවේදය තුල විනිවිදභාවයක් නොතිබුණි.	ඉදිරියේ දී මේ පිළිබඳ අවධානය යොමු කර නව ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා කටයුතු කිරීමට සළකා බලන බව	අදාළ පනතේ නියමයන් ප්‍රකාරව කටයුතු කිරීමට ක්‍රමවේදයක් කඩිනමින් සැකසිය යුතු බව.
(ඈ)	මීපිළිමාන රජයේ බීජ අර්තාපල් නිෂ්පාදන ගොවිපල භාවිතා කරන ට්‍රැක්ටර් 05 ක් සඳහා 2024 වර්ෂය තුල රු.918,936 ක් වටිනා ඩීසල් ලීටර් 2811 ක් නිකුත් කර ඇතත්, එම ට්‍රැක්ටර්වල මයිලෝ මීටරය ක්‍රියාවිරහිත වීම හේතුවෙන් ඉන්ධන භාවිතයේ නිවැරදිතාවය විගණනයට තහවුරු කර ගැනීමට නොහැකි විය.	අදහස් දක්වා නොමැත.	කඩිනමින් මයිලෝ මීටර අළුත්වැඩියා කළ යුතුය.

5. **මානව සම්පත් කළමනාකරණය**

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය තත්‍ය කාර්ය මණ්ඩලය සමඟ සැසඳීමේදී, 2024 දෙසැම්බර් 31 දිනට නිලධාරී පුරප්පාඩු 2875 ක් පැවතුණි. ඒ අතරින් අනුමත ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් 1050 කින් නිලධාරීන් 476 ක් පුරප්පාඩු වී පැවතුණි.	පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව	කාර්ය මණ්ඩල සමාලෝචනයක් සිදු කර අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කර ගැනීමටත් අවශ්‍ය පුරප්පාඩු කඩිනමින් පිරවීමටත් කටයුතු කළ යුතුය.
(ආ)	කෘෂිකර්ම දෙපාර්තමේන්තුව තුල සේවය කර විශ්‍රාම ගොස් ඇති නිලධාරීන් 147 දෙනෙකුගේ විශ්‍රාම වැටුප් ලිපිගොනු යාවත්කාලීන කිරීමට නිලධාරීන් විසින් වසර 01 ත් 18 ත් කාලයක් කටයුතු නොකිරීම හේතුවෙන් එම නිලධාරීන්ට විගණිත 2025 අප්‍රේල් 30 දින දක්වාම විශ්‍රාම හිමිකම ලැබී නොතිබුණි.	විවිධ හේතු මත යාවත්කාලීන කිරීමට නොහැකිව ලිපිගොනු ඉතිරිව පවතින බව හා විශ්‍රාම වැටුප් ගෙවීම ප්‍රමාදවීම වැළැක්වීම සඳහා ආයතනික ක්‍රියාමාර්ග ගෙන ඇති බව.	විශ්‍රාම ලිපිගොනු නොපමාව යාවත්කාලීන කර නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් සකස් කර දීමට පියවර ගත යුතු අතර, විධිමත් පරීක්ෂාවක් කර විශ්‍රාම ගොනු සකස් කිරීමට ප්‍රමාද වුයේ විෂය භාර නිළධාරීන්ගේ හා අධීක්ෂණ නිළධාරීන්ගේ දුර්වලතා හේතුවෙන් නම් අදාළ වගකිවයුතු නිළධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කළ යුතුය.
(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2022 දෙසැම්බර් 19 දින නිකුත් කර ඇති කාර්ය පරිපාටික රීති අංක 2310/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ 244 වගන්තිය ප්‍රකාරව සෑම රජයේ නිලධාරියෙක්ම ස්ථාන මාරු කිරීම්වලට යටත් වුවද, වසර 05 ත් වසර 28 ත් අතර කාලයක් තුල ස්ථාන මාරු නොලබා නිලධාරීන් 145 දෙනෙකු සේවයේ නිරත වන බව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ආයතන 06 ක නියැදියක් පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය විය.	ඉදිරි වාර්ෂික ස්ථාන මාරු යටතේ නිලධාරීන් මාරු කිරීමට කටයුතු කරන බව	වාර්ෂික ස්ථාන මාරු ක්‍රමවේදය විධිමත් පරිදි ක්‍රියාත්මක කළ යුතුය.